

# ජපානය



හිරු නැගෙන දේශය නමින් විරුදාවලී ගත් **ජපානය**, ජපන් ජාතිකයන් විසින් හඳුන්වනු ලබන්නේ "නිප්පොන්/නිහොන්" යනුවෙනි. එය "නි" ඉර සහ "හොන්" මූලය යන වචන ද්විත්වයේ එකතුවෙන් සෑදුනකි. <u>පැසිපික් සාගරයෙන්</u> ද බටහිරින් <u>ජපන් මුහුදු තීරයෙන්</u> ද මායිම්ව මෙම සුන්දර දේශය (**නැගෙනහිර**) ආසියා මහද්වීපයේ (**දුන්නක**) හැඩයෙන් පිහිටා ඇත. ජපානය සතු මුළු බිම් ප්‍රමාණය වර්ග කි. මී. 377,835 කි.

# ජපානයේ සිතියම




ජපානය පළාත් 47කට බෙදා තිබේ.භූගෝලීය හා ඓතිහාසික කරුණු සලකා බලා මේ පළාත් 47 ප්‍රදේ නවයකට බෙදේ.

මේවා

හොක්කයිඩෝ,
තෝහොකු,
කන්තෝ,
චුබු,
කින්කි,
චුගොකු,
ෂිකොකු,
කියුෂු, සහ ඔකිනව වේ.

මේ එක් එක් පළාතක එයට විශේෂ වූ ප්‍රාදේශිය භාෂාවක්,සිරිත් විරිත් සහ සංස්කෘතියක්ද තිබේ.නිදර්ශනයක් වශයෙන් තෝකියෝ නගරය ඇතුළත් වන කන්තෝ ප්‍රදේශයත්, ඔසාකා නගරය තිබෙන කන්සායි ප්‍රදේශයත් ,ආහාර පාන ,සම්ප්‍රදායික කලා ශිල්ප ප්‍රදර්ශන ආදිය එකිනෙකට හාත්පසින් වෙනස් නිසා පළාත් දෙකේ වෙනස්කම් සසඳා බලා විනෝද වීම සමහරුන්ගේ සිරිතයි.

ජපානයේ පූර්ණ ජනගහනය මිලියන 127කි.මෙය ලෝක ජනගහනය අතුරෙන් නවවැන්නයි.රටේ භූමි ප්‍රමාණය හා සසඳන විට,වර්ග කිලෝමීටර් 342ක ජනගහන ප්‍රතිශතය ඉතා ඉහළ එකකි.ජපානයේ භූමි ප්‍රමාණයෙන් 70% ක් කඳුකර ප්‍රදේශ බැවින් ඉතිරි 30% තැනිතලා ප්‍රදේශයි.


# ජපන් භාෂාව

ජපන් භාෂාවේ අක්ෂර මාලා තුනක් ඇත. ජපන් භාෂාවේ අක්‍ෂරවල මූලාශ්‍ර චීන භාෂාවෙන් ලැබුනු අතර මේ චීන අක්‍ෂර අවුරුදු දහස් ගණනකට පෙර චීනයේ ආරම්භ වූ බව ප්‍රචලිතය. මේ අක්‍ෂර කන්ජි යන නමින් හැදින්වේ. මුල් කාලයේ දී මේ අක්ෂර පින්තූර විය. කල්යෑමේ දී මේ පින්තූර ස්වරූපය වෙනස් වීමෙන් දැන් ඒ මුල් අකුරු වලට වඩා බොහෝ වෙනස් ය. දැන් මේ අක්‍ෂර වලින් වචන හෝ වචන කොටස් හැදින්වේ. සාමාන්‍ය පාවිච්චියේ දී කන්ජි අක්ෂර 2000 (දෙදහසක්) පමණ තිබේ. ප්‍රාථමික පාසලේ දී ද 1000 ක් පමණ උගනිති.

කන්ජි වලට අමතරව ශබ්ද අනුව ලියවෙන අක්ෂර මාලා 2 ක් හිරගනා හා කතකනා ජපානයේ භාවිත වේ. මේ දෙකේම මූලාශ්‍රය කන්ජි. එක් අක්ෂර මාලාවක මේ අකුරු 46 ක් තිබෙන අතර, සාමාන්‍යයෙන් ව්‍යාංජනාක්‍ෂර, ශබ්දයක් හා ස්වර ශබ්දයක් (ක් + අ - ක) එක්ව අක්ෂරයක් සෑදේ. මුලින් සෑදෙන ශබ්දයේ වෙනසක් දැක්වීමට තිත් ආදිය යොදාගත් විට, වර්තමාන ජපන් භාෂාවේ සියළු ශබ්ද සඳහා මේ අක්ෂර ප්‍රමාණවත්ය. හිරගනා අක්ෂර කන්ජි හා සම්බන්ධ කරමින් සාමාන්‍ය ජපන් වචන ලියනු ලැබේ. වෙනත් භාෂා වලින් එන වචන - විදේශික පුද්ගල හා ස්ථාන නාම, ශබ්ද හා සතුන්ගේ ශබ්ද ආදිය ලිවීමට කතකනා අක්‍ෂර පාවිච්චි කරනු ලැබේ.

ජපානයේ හෝගෙන් යැයි හැදින්වෙන ප්‍රාදේශීය භාෂා රැසක් ඇත. එකම දෙය හැදින්වීමට ඒ ඒ භාෂාවල වෙන වෙනම ශබ්ද තිබේ. ශබ්ද කිරීම හා උච්චාරණය වෙනස් වන අතර ක්‍රියා පද හා නාම විශේෂණ පදවල අග වෙනස් වේ. නමුත් සාමාන්‍යයෙන් පිළිගත් භාෂාව පාවිච්චි කිරීමෙන් විවිධ පළාත් වලින් එන අයට භාෂාව තේරුම් ගත හැකි වන සේ හසුරුවා ගැනීමට පුලුවන.

**කන්ජි හැදුනු හැටි**




**හිරගනා හා කතකනා අක්‍ෂර සටහනක්**

| | |
|---|---|
| ශබ්දය | හිරගනා<br>කතකනා |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ぱ<br>පා パ | ば<br>බා バ | だ<br>ඩා ダ | ざ<br>සා ザ | が<br>ගා ガ | ん<br>න් ン | わ<br>වා ワ | ら<br>රා ラ | や<br>යා ヤ | ま<br>මා マ | は<br>හා ハ | な<br>නා ナ | た<br>ටා タ | さ<br>සා サ | か<br>කා カ | あ<br>අ ア |
| ぴ<br>පි ピ | び<br>බි ビ | ぢ<br>ජි ヂ | じ<br>ජි ジ | ぎ<br>ගි ギ | | | り<br>රි リ | | み<br>මි ミ | ひ<br>හි ヒ | に<br>නි ニ | ち<br>චි チ | し<br>ෂි シ | き<br>කි キ | い<br>ඉ イ |
| ぷ<br>පු プ | ぶ<br>බු ブ | づ<br>ඩු ヅ | ず<br>සු ズ | ぐ<br>ගු グ | | | る<br>රු ル | ゆ<br>යු ユ | む<br>මු ム | ふ<br>ෆු フ | ぬ<br>නු ヌ | つ<br>ට්සු ツ | す<br>සු ス | く<br>කු ク | う<br>උ ウ |
| ぺ<br>පෙ ペ | べ<br>බෙ ベ | で<br>දෙ デ | ぜ<br>සෙ ゼ | げ<br>ගෙ ゲ | | | れ<br>රෙ レ | | め<br>මෙ メ | へ<br>හෙ ヘ | ね<br>නෙ ネ | て<br>ටෙ テ | せ<br>සෙ セ | け<br>කෙ ケ | え<br>එ エ |
| ぽ<br>පො ポ | ぼ<br>බො ボ | ど<br>දො ド | ぞ<br>සො ゾ | ご<br>ගො ゴ | | を<br>වො ヲ | ろ<br>රො ロ | よ<br>යො ヨ | も<br>මො モ | ほ<br>හො ホ | の<br>නො ノ | と<br>ටො ト | そ<br>සො ソ | こ<br>කො コ | お<br>ඔ オ |

# සකුරා සුවඳින් ලොවම නහවන ජපන් සිහිනයේ යතාර්ථය

## ONLINE සහ PHYSICAL පාඨමාලා

**ජපන් භාෂා විභාග**

- JLPT , NAT - 5
  **පාඨමාලා කාලය - මාස 06**
- JLPT , NAT - 4
  **පාඨමාලා කාලය - මාස 07**

**3 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා**
**පාඨමාලා කාලය - මාස 06**

**6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා**
**පාඨමාලා කාලය - මාස 06**

**OL සිසුන් සඳහා**
**පාඨමාලා කාලය - වසර 2**

**AL සිසුන් සඳහා**
**පාඨමාලා කාලය - වසර 2**

日本語能力試験
JLPT Japanese-Language Proficiency Test

- ජපන් භාෂා ප්‍රවීණතා විභාගයත් ගණනින් කිව්වොත් අදියර 5ක එකතුවක්.
- ඒවා N1, N2, N3, N4, N5 විදියටයි සඳහන් වෙන්නේ.
- මෙතන දී විභාගයේ සංකීර්ණම එක තමයි N1. පටන්ගැන්ම තමයි N5.
- අවුරුද්දකට දෙවතාවක් පැවැත්වෙනවා.
  - ජූලි
  - දෙසැම්බර්

  } පළමුවන සතියේ ඉරිදා
- ශ්‍රී ලංකා ජපන් භාෂා අධ්‍යයන සංගමය හරහා විභාගය සඳහා අයදුම් කරන්න පුළුවනි.

## NAT (Achievement Test for Non – Native speakers)

- අවුරුද්දකට 6 වතාවක් පැවැත්වේ.
  - පෙබරවාරි
  - අප්‍රේල්
  - ජූනි
  - අගෝස්තු
  - ඔක්තොම්බර්
  - දෙසැම්බර්

සූර්යජ ජපන් භාෂා නිපුණතා කේන්ද්‍රය 太陽 Suryaja Japanese Language Center








## රැකියා අවස්ථාවන් සඳහා ජපන් ජාතිකයින් සමඟ සම්මුඛ පරීක්ෂණ වලට යොමුකරන ආකාරය

